# ජාතික ධීවර හා ජලජ සම්පත්

# ප්‍රතිපත්තිය

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

**2006**

*දැක්ම*

ධීවර හා ජලජ සම්පත් තිරසාරිත්ව උපයෝගීතාව පිළිබඳව දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයෙකු බවට ශ්‍රී ලංකාව පත් වෙයි.

*මෙහෙවර*

වර්තමාන සහ අනාගත පරපුරෙහි සුභසිද්ධිය උදෙසා ධීවර හා ජලජ සම්පත් උපයෝජන ක්‍රියාවලිය මෙහෙයවීම.

## ප්‍රත්පත්තිමය අරමුණු

- මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීමෙන් ජනතාව ගේ පෝෂණ තත්වය සහ ආහාර සුරක්ෂිතතාවය නංවාලීම.

- පසු අස්වනු නාස්තිය අවම කිරීම සහ මත්ස්‍ය සැපයුමේ ගුණාත්මක භාවය සම්මත ප්‍රමිතින් කරා නංවාලීම.

- ධීවර කර්මාන්තය හා ආශ්‍රිත කර්මාන්ත මගින් රැකියා උත්පාදනය වැඩි කිරීම සහ ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම.

- මත්ස්‍ය නිෂ්පාදන අපනයනයෙන්  විදේශ විනිමය ඉපයීම නංවාලීම.

- ජලජ පරිසරය සංරක්ෂණය කිරීම.

# ප්‍රතිපත්ති

මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම දරනු ලබන්නේ ධීවර හා ජලජ සම්පත් විෂය භාර අමාත්‍යාංශය විසිනි.

සම්පත් කළමනාකරණයේ දී අමාත්‍යාංශය ආරක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කරනු ඇත.

## සාමුද්‍රික හා අභ්‍යන්තර ධීවර කර්මාන්තය

01 ජාත්‍යන්තර සම්මුතීන්ට සහ ප්‍රඥප්තීන්ට අනුකූලව වගකිවයුතු ධීවර කර්මාන්තයක මූලධර්ම ප්‍රවර්ධනය කිරීම.

02 ධීවර හා ජලජ සම්පත් සමීක්ෂණ , තොග ඇගයීම් හා ගවේෂනාත්මක ධීවර කටයුතු උදෙසා ප්‍රමුඛතාව දීම.

03 දැනට නෙලාගනු නොලබන මසුන් නෙලාගැනීම සඳහා උචිතවන තාක්ෂණය හඳුන්වාදීම.

04 විනාශකාරී හා හානිකර ධීවර පන්න ක්‍රම සහ ක්‍රියාකාරකම් භාවිතය වැලැක්වීම.

05 කරමල් දැල් භාවිතය අවම කිරීම සඳහා වෙනත් පන්න ක්‍රම ප්‍රවර්ධනය කිරීම.

06 මත්ස්‍ය නිෂ්පාදනයට හා රැකියා උත්පාදනයට වෙරළාසන්න ධීවර කර්මාන්තය දක්වන ඉහළ දායකත්වය සැළකිල්ලට ගෙන එම සම්පත් හීනවීමේ අවදානම වැලැක්වීම සඳහා එහි කළමනාකරණයට ප්‍රමුඛත්වයක් දීම

07 වෙරළාසන්න ධීවර කර්මාන්තයට හානිකර ලෙස බලපාන පමණ ඉක්මවා සිදු කෙරෙන ධීවර කටයුතු වෙනත් අතකට යොමුකොට විකල්ප ආදායම් මාර්ග එම ක්ෂේත්‍රය තුලින් බිහිකරලීමට කටයුතු යෙදීම.

08 වෙරළාසන්න ධීවර කර්මාන්තයේ සම්ප්‍රදායික ධීවරයා සතු අයිතිය තහවුරු කිරීම.

09 ධීවර ප්‍රජාවගේ අවශ්‍යතාවන්ට හා ධීවර කටයුතුවලට බලපෑමක් නොවන ආකාරයට සමුද්‍රිය පාරිසරික සංචාරක කර්මාන්තය හා විනෝදය පිණිස මසුන් ඇල්ලීම වැනි තෝරාගත් වාණිජ කටයුතු ප්‍රවර්ධනය කිරීම.

10 සම්මත ප්‍රමිතීන්ට අනුකූලව බහුදින ධීවර යාත්‍රාවල ආරක්ෂාකාරිබව සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා යාත්‍රා සැලසුම් කිරීම දිරිමත් කිරීම

11 ජාත්‍යන්තර ප්‍රඥප්තීන්ට අනුකූලව කරමල් දැල් ධීවර කර්මාන්තය අවම කිරීම සඳහා මරු වැල් පන්න ක්‍රම ප්‍රචලිත කිරීම.

12 ධීවර සම්පත් අනවසරයෙන් නෙලාගැනීම වැලැක්වීම සඳහා ධීවරයන්ගේ සහභාගිත්වයෙන් සෝදිසි මෙහෙයුම් (MCS) කටයුතු වැඩි දියුණු කිරීම සහ යාත්‍රා අධීක්ෂණ මෙහෙයුම් පද්ධතියක් (VMS) ස්ථාපිත කිරීම.

13 දේශීය බහුදින ධීවර යාත්‍රා ජාත්‍යන්තර මුහුදේ ධීවර කර්මාන්තයට යොමු කර වීම

14 ජාත්‍යන්තර මුහුදේ ධීවර කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන සමග සහයෝගතාව වර්ධනය කිරීම සහ ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව කටයුතු කිරීම

15 ජාත්‍යන්තර මුහුදු ධීවර කර්මාන්තය දියුණුකිරීම සඳහා දේශීය හා විදේශීය පුද්ගලික අංශයේ ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම

16 මිරිදිය ධීවර කර්මාන්තය පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය ලබා ගෙන සංවර්ධනය කිරීම

## ජලජීවී වගාව:

17 වාරිමාර්ග ජලාශවල ධීවර කටයුතුවල යෙදීමට ධීවරයාට ඇති අයිතිය සුරක්ෂිත කිරීම.

18 වෙළඳපල ඉලක්ක කරගත් පරිසර හිතකාමී සහ සමාජයට පිළිගත හැකි ජලජීවී වගාවන් සංවර්ධනය කිරීම

19 ජලජීවී වගා සංවර්ධන ක්ෂේත්‍රයේ ආයෝජනය සඳහා දේශීය හා විදේශීය පුද්ගලික අංශය දිරිගැන්වීම

20 ප්‍රජා දායකත්වය ඇතිව ජලජීවී වගා කටයුතු ආරම්භ කිරීම සඳහා පුද්ගලික අංශයේ ආයෝජකයින් දිරිගැන්වීම.

21 කලාපීයකරණ සැලසුම් (Zonal Plans) මත ඉස්සන් වගා ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සහ පොදු යටිතල පහසුකම් සැපයීම

22 ඉස්සන් කර්මාන්තය නිසා හානියට පත්වූ පරිසරය පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රමුඛත්වය දීම

23 ස්වයං නියාමනයක් ඇති කිරීම උදෙසා වඩාත් ඵලදායී කාර්ය භාරයක් ඉටු කරලීම සඳහා ඉස්සන් වගාකරුවන්ගේ සංගම් දිරිගැන්වීම සහ මනා කළමනාකරණ ක්‍රියාකාරකම් (Best Management Practices) හඳුන්වා දීම

24 ස්වාභාවිකව මත්ස්‍ය ගහණ වලට ධීවමර කර්මාන්තයෙන් සිදුවන බලපෑම අවම කිරීමේ අරමුණින් කරදිය සහ මිරිදිය ජලජීවී වගාව හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය සඳහා පුද්ගලික අංශය දිරිගැන්වීම.

25 නැවත මිලදී ගැනීමේ ක්‍රමය යටතේ, බාහිර වගාකරුවන් යොදා ගනිමින් විසිතුරු මත්ස්‍ය ව්‍යාපෘති ආරම්භ කිරීමට පුද්ගලික අංශය දිරිගැන්වීම.

26 මත්ස්‍ය වගාව හා මසුන් ඇල්ලීම මඟින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකර ගැනීම පිණිස නිත්‍ය හා කාලීන ජලාශවල මත්ස්‍ය ගහන ගණත්වය වැඩිකිරීම

## යටිතල පහසුකම්

27 වරාය, නැංගුරම් පොලවල් හා තොටුපලවල් වැනි ධීවර කර්මාන්තය සඳහා වැදගත් සේවාවන් හා වෙරළ ආරක්ෂක ව්‍යුහයන් ඇතුළු පොදු යටිතල පහසුකම් සැලසුම් කිරීමේ දී ක්‍රියාත්මක කිරීමේ දී සහ කළමනාකරණයේ දී පාර්ශවකරුවන් හවුල් කර ගැනීම

28 ධීවර වරාය, නැංගුරම්පල හා තොටුපල සඳහා ශීතාගාර, දියත්මං, අයිස්, ජලය හා මත්ස්‍ය ප්‍රවාහන පහසුකම් වැනි සේවාවන් හා ව්‍යුහාත්මක පහසුකම් සැපයීම සඳහා පුද්ගලික අංශයේ හවුල් සහභාගිත්වය ලබා ගැනීම.

29 ඉදිකිරීම, මෙහෙයවීම හා පැවරීම (Built, Operate & Transfer) පදනම මත නව වරායන් ඉදිකිරීම ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සැපයීම සඳහා ආයෝජන කිරීමට දේශීය හා විදේශීය පුද්ගලික අංශය දිරි ගැන්වීම.

30 මසුන් සකස් කිරීම හා බඳුන්ගත කිරීමේ පහසුකම් ස්ථාපනය සඳහා දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වීම

## අලෙවිය

31 ධීවර කාර්මිකයාගේ ධීවර නිෂ්පාදන සඳහා තරඟකාරී මිලක් ලබා දීම සහ පාරිභෝගිකයාට මසුන් සාධාරණ මිලකට ලබා දීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම.

32 මිරිදිය ධීවරයින් හට වැඩි ආදායම් අවස්ථා සලසා දීමේ අරමුණින් මුහුදු මසුන් පරිභෝජනය සුලභ නාගරික ප්‍රදේශවල ද මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනවල පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම.

33 අගය එකතු කරන ලද මත්ස්‍ය නිෂ්පාදනය හා පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම

34 අගය එකතු කරන ලද මත්ස්‍ය නිශ්පාදන අපනයනය දිරිගැන්වීම.

35 දේශීය මත්ස්‍ය සැපයුමට අදාල සෞඛ්‍ය ආරක්ෂිත තත්ව පවත්වා ගැනීම

## පර්යේෂණ

36 ප්‍රමාණවත් අවධානයක් යොමු නොවූ අජීවී සම්පත් ගවේෂණ කටයුතු සඳහා විශේෂ අවධානයක් යොමුකොට ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍ර සංවර්ධනයට ඉවහල්වන ව්‍යවහාරික පර්යේෂණ සඳහා ප්‍රමුඛත්වය ලබාදීම

## අජීවී ජලජ සම්පත්

37 අජීවී ජලජ සම්පත් උපයෝජනය හා සාගර බලශක්තිය යොදාගැනීම සඳහා දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වීම

## ව්‍යාප්ති හා පුහුණු සේවා

38 ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අවශ්‍ය තොරතුරු හා තාක්ෂණය ප්‍රජාව ඇතුළු පාර්ශවකරුවන් වෙත ගෙනයාම සඳහා ව්‍යාප්ති සේවා ජාලය ශක්තිමත් කිරිම.

39 නිපුනතා සංවර්ධනය සඳහා ජාතික සහ ජාත්‍යන්තර සංවිධානවල සහාය ලබා ගැනිම

## ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික මට්ටම ඉහළ නැංවීම

40 ප්‍රජා මූලික ධීවර සංවිධාන ශක්තිමත් කිරිම

41 ස්වාභාවික උපද්‍රව වලට මුහුණ දියහැකි අයුරින් ධීවර ප්‍රජාවගේ හැකියාව වර්ධනය කිරිම

42 මුහුදු අනතුරු වලක්වා ගැනිම හා පිඩාවට පත්වූවන් බේරා ගැනිම සඳහා සහන සේවා ශක්තිමත් කිරිම

43 ධීවර ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගිත්වය වැඩි කිරිම

44 ආදායම් කළමනාකරණය, සකසුරුවම සහ ඉතුරුම් වර්ධනය සඳහා ධීවර ප්‍රජාව දිරිමත් කිරිම.

## *උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ධීවර කර්මාන්තය පුනරුත්ථාපනය කිරිම*

45 ගැටුම්කාරි තත්ත්වයන් නිසා හානියට පත්වූ උතුරු නැගෙනහිර ප්‍රදේශවල ධීවර කටයුතු පුනරුත්ථාපනය හා සංවර්ධනය කිරිම සඳහා ප්‍රමුඛතාවක් ලබාදිම

46 අවතැන් වූ ධීවරයන් ස්වකීය ගම්මානවල නැවත පදිංචි කිරිම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරිම හා ඒ අනුව ඔවුන්ට තම ජිවිකාව යළි ඇරඹීමට ඉඩ සළස්වා දීම.

47 සුනාමි ව්‍යසනයෙන් හානියට පත්වූ ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍රය නවීකරණය පදනම්කරගෙන පුනරුත්ථාපනය කිරිම

## ආයතනික හා නීතිමය රාමුව

48 ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතන, කාලීන අවශ්‍යතාවයනට ගැළපෙන පරිදි ප්‍රතිව්‍යුහගත කිරිම.

49 වෙනත් නීතිවල ඇති ප්‍රතිවිරුද්ධ නෛතික විධිවිධාන සමාලෝචනය කර උචිත ප්‍රතිශෝධනයන් හඳුන්වා දිම.

## ජාත්‍යන්තර සහයෝගීතාව

50 ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය උදෙසා විදේශ රටවල් සමග ද්වි පාර්ශ්වීය, බහු පාර්ශ්වීය හා කලාපීය සහයෝගීතා ගිවිසුම වලට එළඹීම

## පරිසරය

51 වෙරළබඩ පරිසරය සුරැකීම සහ ප්‍රවර්ධනය

52 ක්ෂේත්‍රයේ, නිෂ්පාදන හා සේවා ක්‍රියාවලිය සඳහා "සුපිරිසිදු නිෂ්පාදන සංකල්පය" (Cleaner Production Concept) යොදාගැනීම

53 ක්ෂේත්‍රයට අදාල සියළු කටයුතුවලදී පරිසරය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ප්‍රමුඛත්වයක් ලබාදීම